**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි .

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,046.64 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,330.12 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 716.52 ක් හෙවත් සියයට 35 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 219.14 | 207.61 | 11.53 | 5.26 |
| මූලධන | 1,827.50 | 1,122.51 | 704.99 | 38.58 |
| **එකතුව** | **2,046.64** | **1,330.12** | **716.52** | **35.01** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 9.00 | 8.98 | 7.00 | 10.02 | 39.00 | 33.38 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අග්‍රිම ගිණුම් අංක 7002/0000/00/0091/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 8.13 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 37.57 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0024/000 | 14.63 |
| 6000/0000/00/0016/0057/000 | 13.53 |
| 6000/0000/00/0002/0110/000 | 6.38 |
| 6000/0000/00/0013/0092/000 | 3.03 |
| **එකතුව** | **37.57** |

**2.5 විගණන නිරීක්ෂණය**

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. මාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඌ) | වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (එ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වෙනත් මූලධන ආයෝජන වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 661.68 ක ඉතිරිවීම් තිබුණු අතර බැරකම් වශයෙන් දක්වා තිබුණේ රු.මිලියන 346.52 ක් බැවින් අධි ප්‍රතිපාදන සලසා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඉන්ධන වැය විෂයය සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක අනිවාර්යය ඉතිරි කිරීමක් කළ යුතු වුවද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරි කර තිබුණේ සියයට 11.41 ක් පමණි. තවද මුදල් රෙගුලාසි 66 අනුව රු.මිලියන 0.6 ක ප්‍රතිපාදන දේශීය ගමන් වියදම් වැය විෂයයෙන් මාරු කර ගෙන තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

**------------------------**

වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 0.5 ක් වූ තැන්පතු 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

විෂය අංක 29101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 0.69 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ මාස 04 සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, ඒවා අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) වර්ෂ 2 ත් වර්ෂ 12 ත් අතර කාලසීමාවක් තුළ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් සිව් දෙනෙකුගේ ණය ශේෂ රු.මිලියන 0.3 ක් වූ අතර මෙම ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිල වාහන දෙකක් අනුයුක්ත කර තිබීම හේතුවෙන් සැමවිටම එක් වාහනයක් ඌන උපයෝජිතව තිබුණි. ඒ අනුව 2015 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා එක් වාහනයක් දින 343 ක් ධාවනයේ යොදවා නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව සිදු කළ යුතු භාණ්ඩ සමීක්ෂණය 2016 වර්ෂය වෙනුවෙන් නියමිත කාලවකවානු තුළ සම්පූර්ණ කර නොතිබුණි.

(ii) වර්ෂය ආරම්භක දිනට පැවති වත්කම් ශේෂයට වර්ෂය තුළ මිලදී ගත් හා වර්ෂය තුළ අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම් නිවැරදිව ගැලපුම් කර නොතිබීම නිසා අවසාන ශේෂය නිවැරදි වී නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර තිබූ වාහන 05 ක් අවිධිමත් ලෙස ව්‍යාපෘතියට පවරා තිබුණු අතර දෙපාර්තමේන්තුවේ රියදුරන් දෙදෙනෙක්ද ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කර තිබුණි. මෙම රියදුරන් දෙදෙනාට 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට දෙපාර්තමේන්තුවෙන් වැටුප් ලෙස රු.මිලියන 1.65 ක් ගෙවා තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා මූලධන වැය විෂයයකට අදාළ රු.මිලියන 0.1 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. මිලියන | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත හා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ(සංශෝධන) පනත | | |
| (i) 9(2) වගන්තිය | -- | අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙරළ කලාප ඇතුළත සියලු සම්පත් හා කටයුතු පිළිබඳ කරනු ලබන සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගත් වෙරළ කලාපය සහ වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේ සැලැස්මක් පිළියෙල කළ යුතුව තිබුණි. එමෙන්ම එම සැලැස්ම අවුරුදු 05 කට වරක් ප්‍රතිශෝධනය කළ යුතු වුවත් වර්තමානය වන විටත් 1997 වර්ෂයේදී පිළියෙල කරන ලද ඉහත සැලැස්මම ප්‍රතිශෝධනය නොකර ක්‍රියාත්මක කර තිබුණි. |
| (ii) 31 වගන්තිය | 2.95 | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට අය කර ගන්නා සියලු දඩ මුදල් බැර කර එහි ගිණුම් වාර්ෂිකව විගණකාධිපතිට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පනත අනුව කටයුතු කර නොතිබුණු අතර මෙම අරමුදල නමින් පවත්වා ගෙන යනු ලබන ජංගම බැංකු<br><br>ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 2.95 ක් විය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| VIII පරිච්ඡේදයේ 9.8 වගන්තිය | 0.03 | වගන්තියේ විධිවිධානවලට පටහැනිව මාණ්ඩලික නොවන තනතුරක් වන දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරු සඳහා 1/20 දීමනාව ගෙවා තිබුණි. |

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(2) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 0.6 | • කිසියම් කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියකුගේ සෘජු අධීක්ෂණය යටතේ රු.25,000 ක උපරිමයකට යටත්ව අතුරු අග්‍රිම ලබා දිය යුතු වුවත් එම විධිවිධානයන්ට පටහැනිව අවස්ථා 13 කදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| | 0.88 | • චක්‍රලේඛය අනුව එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවද ඊට පටහැනිව අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. |
| | 0.56 | • යම් විශේෂිත කාර්යයකට ආසන්න දිනයකදී අත්තිකාරම් මුදල ලබා දිය යුතු අතර එම කාර්යය නිම කළ වහාම එය පියවිය යුතු වුවත් ඊට පටහැනිව ලබා ගත් කාර්යය සඳහා කිසිදු මුදලක් හෝ ඉන් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් වැය නොකර මාසයකට වැඩි කාලයක් දක්වා අත රඳවාගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1.1 | දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත් එකතුව රු.මිලියන 1.1 ක් වූ විවිධ කාර්යයන් සඳහා ලබා ගෙන තිබූ අත්තිකාරම් මුදල් මාස 01 සිට මාස 05 දක්වා ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (iiii) මුදල් රෙගුලාසි 447 | -- | වර්ෂය තුළ ලද ප්‍රතිපාදන, වැය කළ හා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය සඳහන් කරමින් වැය ලෙජරය පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1646 | -- | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | -- | දෙපාර්තමේන්තුවේ වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| (ii) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1.3.1 ඡේදය | -- | නියෝජ්‍ය මට්ටමේ තනතුරු දරන රාජ්‍ය නිලධාරීන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි වුවත් එසේ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකුට නිල වාහන අනුයුක්ත කර තිබුණි. |

**3.7 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

සමාලෝචිත වර්ෂයේ සැලසුම් කළ රු.මිලියන 225.5 ක් වූ ව්‍යාපෘති 11 ක් නිම කිරීමේ ප්‍රගතිය සියයට 10 සිට සියයට 75 දක්වා වූ අතර වැය කළ මුදල රු.මිලියන 120.34 ක් වී තිබුණි.

(ආ) **ව්‍යාපෘති ඉටු නොකිරීම**

සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 06 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 39 ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද සැලසුම් කළ පරිදි අදාළ ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

(ඇ) **ව්‍යාපෘති ඉටු නොකර අතහැර දැමීම**

2015 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ රු.මිලියන 90 ක ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂයේදීද ඉටු නොකර අතහැර දමා තිබුණි.

(ඈ) අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පවතින බව දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛනවලින් නිරීක්ෂණය වේ. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් ප්‍රමාණය | 388 | 146 | 338 | 127 | 285 | 308 | 1592 |
| කඩා ඉවත් කිරීමට නියෝග කළ ප්‍රමාණය | 388 | 146 | 338 | 127 | 285 | 308 | 1592 |
| කඩා ඉවත් කරන ලද ප්‍රමාණය | 83 | 34 | 0 | 8 | 13 | 13 | 151 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කඩා ඉවත් කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | 21.39 | 23.29 | 0 | 6.3 | 4.56 | 4.22 | 9.48 |
| උසාවි නියෝග අනුව කඩා ඉවත් කළ ප්‍රමාණය | 0 | 9 | 5 | 7 | 6 | - | 27 |
| වැය කළ වියදම (රු.මිලියන) | 3.05 | 3.04 | 5.99 | 0.03 | 0.09 | 0.05 | 12.25 |

2011 වරෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 06 තුළ කඩා ඉවත් කිරීමේ නියෝග 1592 ක් නිකුත් කර තිබුණද කඩා ඉවත් කර තිබුණේ ඉදිකිරීම් 151 ක් බැවින් ප්‍රගතිය සියයට 9.48 ක් විය.

## 3.8 අවිධිමත් ගනුදෙනු

--------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) හා 5.3.14 (අ) මාර්ගෝපදේශයන්ට අනුව ලංසු කැඳවීමේ ලේඛනවල සියලු කරුණු ඇතුළත්ව මිල ගණන් කැඳවිය යුතුය. එසේ වුවත් වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතිවල මිල ගණන් කැඳවීමේදී ලංසු ලේඛනවල එකිනෙකට වෙනස් කොන්දේසි ඇතුළත් කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂිතය සියයට 5 කට නොඅඩු මුදලක් රඳවා තබාගත යුතු වුවත් එගොඩ උයන දියකඩනය සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී නියමිත කාර්යසාධන සුරක්ෂිතයට වඩා රු.මිලියන 0.1 ක් අඩුවෙන් ලබා ගෙන තිබුණි. කප්පල් අඩිය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂිත ලබා ගෙන නොතිබුණි.

(iii) තරඟකාරිත්වයක් නොමැති අවස්ථාවකදී ලංසු ප්‍රතික්ෂේප කළ යුතු වුවත් කප්පල් අඩිය ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1, 7.12.2 හා 7.12.13 මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) ගිවිසුම් පරිදි කොන්ත්‍රාත් ඉටු නොකරන සැපයුම්කරුවන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.5 මාර්ගෝපදේශය ප්‍රකාරව අසාදු ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) 2016 වර්ෂයේ කාර්යසාධන වාර්තාවලට අනුව උක්ත තලවිල උතුර ග්‍රොයිනය හා එගොඩ උයන දියකඩනය ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස ප්‍රගති වාර්තාවල සඳහන් වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශයට අනුව වැඩ අවසන් කිරීමේ වාර්තා සකස් කර නොතිබුණි.

**3.9 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2016 විසර්ජන ගිණුමේ ඕඅීපීඑස්ප් 7(l) හි තවදුරටත් ඉදිරියට ගෙන යන කපා නොහළ අලාභ හානි ශේෂය රු.මිලියන 0.01 ක් වූ අතර මුදල් රෙගුලාසි 109 හා 113 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණය කිරීම සම්බන්ධ කොන්ත්‍රාත් හා ගිවිසුම් අනුව නියමිත පරිදි ඉටු නොකිරීම මත අය කළ යුතු ප්‍රමාද ගාස්තුව රු.මිලියන 2.59 ක් වුවද එය අය කර ගෙන නොතිබුණි.

**3.10 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවරැදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (අ) | 2013 | 8.10(ආ) | දෙපාර්තමේන්තුවට වත්කම් පවරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සිදු වූ රු.මිලියන 4.09 ක් වූ පාඩුව සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ආ) | 2013 | 8.12(අ)(ii) | කැපුන්ගොඩ දියකඩනයේ අපේක්ෂිත අරමුණ ඉටු නොවන ආකාරයෙන් ඉදිකිරීම නිසා කොටසක් කඩා ඉවත් කිරීමෙන් දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.මිලියන 25.78 සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ඇ) | 2014 | 9.12(ආ) | කඩා ඉවත් කිරීමේ නියෝගය නිකුත් කිරීමෙන් අනතුරුව එම කාර්යය සඳහා අවසර පත්‍රයක් ලබා දීම හා ඒ සඳහාම නැවත වරක් නිකුත් කළ කඩා ඉවත් කිරීමේ නියෝගය අනුව සම්පූර්ණ ගොඩනැගිල්ල ඉවත් කළ යුතු වුවද තට්ටු 04 කින් සමන්විත මෙම ගොඩනැගිල්ලේ මහල් 02 ක් පමණක් කඩා ඉවත් කර තිබීම. |
| (ඈ) | 2014 | 9.14(ආ) | තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව වැඩිම ලකුණු ලබා ගත් සමාගම නොසලකා දෙවැනි අවම මිල ගණන් ඉදිරිපත් කළ සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.මිලියන 89.83 ක් වීම. |

(ඉ) 2014 9.14(ඈ) දියකඩන ඉදිකිරීම් හා වැලි පෝෂණ කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹී ගිවිසුම්ගත කාලයට අනුගතව වැඩ නොකිරීම මත අය විය යුතු රු.මිලියන 11.49 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබීම.

(ඊ) 2015 3.5 (අ) 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධන පනත අනුව දෙපාර්තමේන්තුව විසින් 2011 සිට 2015 කාලපරිච්ඡේදය තුළ දී කඩා ඉවත්කිරීම් සඳහා වැය කළ රු.මිලියන 12.23 ක් වූ මුදල අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.

(උ) 2015 3.7(අ) උණවටුන වැලි පෝෂණ ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු අතර 2014 දෙසැම්බර් 04 දින ඇති කරගත් ගිවිසුම අනුව ඉටු කළ කාර්යයෙහි වැඩ සහතික මත නොව කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත වැඩියෙන් සැපයූ වැලි ඝන මීටර් 14,070 ක් වෙනුවෙන් කළ ගෙවීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.මිලියන 20.1 ක් විය.

(ඌ) 2015 3.7 (ආ) උණවටුන දියකඩනය ඉදිකිරීමේදී විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කර නොතිබීම නිසා මෙම දියකඩනයේ ගැලවූ කොටස ඉදිකිරීම, එම කොටස නැවත ගලවා ඉවත් කිරිම හා ප්‍රමාද ගාස්තු අඩුවෙන් අය කිරිම නිසා දෙපාර්තමේන්තුවට සිදු වූ මුළු පාඩුව රු.මිලියන 71.49 ක් විය.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 29 | 12 |
| (ආ) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (ඇ) | ද්විතියික මට්ටම | 321 | 247 | 74 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 174 | 108 | 66 |
| | **එකතුව** | **540** | **385** | **155** |

පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සේවක පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 217 ක් හා 155 ක් වූ අතර මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.